# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1596/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 17/10/2024<br>පැය 1235 |

## මාධ්‍ය නිවේදනය

<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01. විදේශ රටක නිෂ්පාදිත දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.10.16 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තලංගම පොලිස් වසමේ වැටලීමක් සිදුකර විදේශ රටක නිෂ්පාදිත දුම්වැටි සහ විවිධ පුද්ගලයින් කිහිපදෙනෙකුට අයත් ජාතික හැඳුනුම්පත් සහ රියදුරු බලපත්‍ර කිහපයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තලංගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන තලංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තලංගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවි 05ක් සමඟ සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුර.**

2024.10.15 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සූරියවැව පොලිස් වසමේ වල්පසපුගල සහ සූරියවැව ප්‍රදේශවලදී වැටලීම් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවි 05ක් සමඟ සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට ගෙන සූරියවැව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 28ත් 47 ත් අතර වයස් වල පසුවන සූරියවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සූරියවැව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නීති විරෝධීව වගා කරන ලද ගංජා පැල සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.10.16 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොස්ලන්ද පොලිස් වසමේ අඹකොළආර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර නීති විරෝධීව වගා කරන ලද ගංජා පැල සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කොස්ලන්ද පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 40 ක් හා 66 ක් වන වන ජුලන්පිටිය හා අඹගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොස්ලන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**